# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1715/22 – 2011 ජූලි 21 වැනි බ්‍රහස්පතින්දා – 2011.07.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2011 අංක 144 දරන ආඥාව**

මගේ යොමු අංකය: 13/97/එන්එච්/512.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: හාප/සං/01/ඉඅ/51.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2011 ජූලි මස 07 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'ගොවිජන මන්දිරය',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, හාරිස්පත්තුව.

2. **ඉඩමේ විස්තරය.**– මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුළුගම්මනසිය පත්තුව සුළු කොට්ඨාසයේ, යටිවාවල ගමේ පිහිටි මහනුවර කොට්ඨාස භාර මැනුම් අධිකාරි විසින් 1992.07.20 දිනැතිව සකස් කර ඇති අංක මහ 3785 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති මීරාකොටුවවත්ත හෙවත් මොරගිරිය නමැති ප්‍රමාණයෙන් හෙක්. 1.1550ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස.

උතුරට: කොස්ගහමුල කුඹුර, හපුගස්අංගවත්ත, හපුගස්අංගවත්ත, හපුගස්අංගකුඹුර, පරණවලව්වේවත්ත හා මහාමාර්ගය; නැගෙනහිරට: මහා මාර්ගය; දකුණට: මහා මාර්ගය, මීරාකොටුවවත්ත සහ නිවාසවලට යන පාර; බටහිරට: මීරාකොටුවවත්ත.

08 - 116

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2011 අංක 145 දරන ආඥාව**

මගේ යොමු අංකය: එල්ඩී/05/2008/ඊ/457.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 2/2/1/111.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා ඉඩම්

සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2011 ජූලි මස 13 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'ගොවිජන මන්දිරය',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, ගම්පහ.

2. **ඉඩමේ විස්තරය.**– ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපත්තුව සුළු කොට්ඨාසයේ, බැණ්ඩියමුල්ල ගමේ පිහිටි මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද ගම්/ගම්/2009/213 සහ 2009.08.10 දිනැති ප්‍රගමන අනුරේඛනයේ ප්‍රමාණයෙන් හෙක්. 0.0898ක් පමණ වූ ඉඩම් කැබලි 03ට මායිම්:

01. **කැබලි අංක 1 – දවටගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0068ක් පමණ**
උතුරට: රත්නාවලී බාලිකා විද්‍යාලයට අයත් ක්‍රීඩා පිටිය සහ ඇළ; නැගෙනහිරට: ඇළ සහ කැබලි අංක 2; දකුණට: කැබලි අංක 2, ඒ. ඩී. එල්. සී. ජයවර්ධන අයිතිවාසිකම් කියන දවටගහවත්ත ඉඩම සහ කැබලි අංක 03; බටහිරට: රත්නාවලී බාලිකා විද්‍යාලයට අයත් ක්‍රීඩා පිටිය (ව.මී. 68).

02. **කැබලි අංක 2 – දවටගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0747ක් පමණ**
උතුරට: කැබලි අංක 1 සහ ඇළ; නැගෙනහිරට: ඇළ සහ අශෝකා මෙත්තානන්ද අබේරත්න අයිතිවාසිකම් කියන දවටගහවත්ත; දකුණට: අශෝකා මෙත්තානන්ද අබේරත්න අයිතිවාසිකම් කියන දවටගහවත්ත, ඒ. ඩී. එල්. සී. ජයවර්ධන අයිතිවාසිකම් කියන දවටගහවත්ත ඉඩම සහ කැබලි අංක 03; බටහිරට: කැබලි අංක 01 (ව.මී. 747).

03. **කැබලි අංක 3 – ප්‍රවේශ මාර්ගය – ප්‍රමාණය: හෙක්. 0.0083ක් පමණ (ව.මී. 83).**

08 - 117

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

### 2011 අංක 146 දරන ආඥාව

මගේ යොමු අංකය: 03ජේ/95/ඊ/206.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:ගොප්‍රාලේ/ඉ11/7/8.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2011 ජූලි මස 13 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
'ගොවිජන මන්දිරය',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, ගොඩකවෙල.

2. **ඉඩමේ විස්තරය.**– රත්නපුර දිස්ත්‍රික්කයේ, ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැදපත්තුව සුළු කොට්ඨාසයේ රක්වාන (කොටසක්) ගමේ පිහිටි රත්නපුර මැනුම් අධිකාරි විසින් සකස් කරන ලද අංක මු.පි.ර. 254 දරන 2007.02.20 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් සඳහන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0312ක් වූ අඹගහවත්ත, පන්සලේගොඩැල්ල, පනාගොඩවත්ත නමැති ඉඩම් කොටසට මායිම්:

උතුරට: රක්වාන ගඟ සහ න.පි. 57හි කැබලි අංක 146; නැගෙනහිරට: න.පි. 57හි කැබලි අංක 146 සහ 147; දකුණට: න.පි. 57හි කැබලි අංක 147 සහ 146; බටහිරට: මු.පි.ර. 32හි කැබලි අංක 1 සහ රක්වාන ගඟ.

08 - 118

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.